## බදාදා

පළමුවන කියැවීම රෝම 13: 8-10

ශුද්ධ වූ පාවුළු තුමන් විසින් රෝමවරුන් වෙත යවන ලද හසුනෙන් කොටසකි.

ඔබ ප්‍රේම කිරීමෙන් ව්‍යවස්ථාව සම්පූර්ණ කරන්නේ ය.

එකිනෙකාට ප්‍රේම කිරීම හැර අන් කිසිවක් ගැන කිසිවෙකුට ණය ගැති නොවන්න. අසල්වැසියාට ප්‍රේම කරන්නෝ ව්‍යවස්ථාව ඉටු කරති. මන්ද, "කාමමිථ්‍යාචාරය නොකරන්න. මිනී නොමරන්න. සොරකම් නොකරන්න. ලෝභ නොවන්න." යන ආඥා ද තවත් සමහර ආඥා ඇත්නම් ඒවා ද, "නුඹ නුඹට ප්‍රේම කරන්නාක් මෙන් නුඹේ අසල්වැසියාට ප්‍රේම කරන්න" යන පාඨයෙහි සම්පිණ්ඩනය වී ඇත. ප්‍රේමය අසල්වැසියාට නපුරක් නොකරයි. එබැවින් ප්‍රේමය නම්, ව්‍යවස්ථාව සම්පූර්ණයෙන් ඉටු කිරීමය.

දේව වචනය මෙසේ ය.

පිළිතුරු ගීය ගීතාවලිය 112: 1-2, 4-5, 9

පිළිතුර : අවංක ව දානශීලී ව කටයුතු කරන්නෝ භාග්‍යවන්තයෝ ය.

ගීය : සමිඳුන් පසසන්න. සමිඳුන් වෙත ගරු බිය ඇතිව සිටින්නා ද
එතුමන්ගේ ආඥාවලට බොහෝ සේ ප්‍රිය වන්නා ද භාග්‍යවන්ත ය.
ඔහුගේ පරපුර දේශයෙහි බලවත් වන්නේ ය.
දැහැමි පරපුර ආසිරි ලබන්නේ ය.

සුදනාට අඳුරෙහි එළියක් උදා වන්නේය.
ඔහු දයාවන්තය, සානුකම්පිතය, දැහැමිය.
දානශීලීව ණයට දෙන මිනිසාට සුබ සෙත වේ.
ඔහු සිය කටයුතු අවංක ලෙස කරන්නේය.

ඔහු දිළිඳුන්ට නොමසුරුව දෙන්නේය.
ඔහුගේ දැහැමිකම සදාකල් පවත්නේය.
ඔහු ගරු සම්මාන ලබා බලවත් වන්නේය.

සුපුවත් ජය නද

ආලේලූයා! ආලේලූයා!
සමිඳුනි, ඔබේ මහා කරුණාව ලෙස අප පණගැන්වුව මැනව.
අපි ඔබ වදාළ ශික්ෂා පද පිළිපදින්නෙමු.
ආලේලූයා!

නොහොත්

සුපුවත් ජය නද 1 පේදුරු 4: 14

ආලේලූයා! ආලේලූයා!
"ක්‍රිස්තුස් වහන්සේගේ නාමය නිසා නින්දා කරනු ලබන්නහු නම්
ඔබ ආශිර්වාද ලද්දහු ය.
මන්ද, තේජාන්විත ආත්මයාණන් වහන්සේ වන දෙවියන් වහන්සේගේ
ආත්මයාණෝ ඔබ කෙරෙහි රඳන සේකැ" යි
සමිඳාණන් වහන්සේ වදාරන සේක.
ආලේලූයා!

සුවිශේෂය ලූක් 14: 25-33

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

"තමන් සතු සියල්ල අත් නොහරින කිසිවෙකුට මාගේ ගෝලයකු වන්නට බැරි ය."

තවද, මහා ජනකායක් ජේසුස් වහන්සේ සමඟ ගමන් ගත්හ. උන්වහන්සේ හැරී ඔවුන්ට මෙසේ වදාළ සේක. "මා වෙත එන තැනැත්තේ මට වඩා තම පියාට ද මවට ද භාර්යාවටද, දරුවන්ට ද සහෝදරයන්ටද සහෝදරියන්ටද තමාගේ ම ජීවිතයට වුවද ප්‍රේම කරන්නේ නම්, ඔහුට මාගේ ගෝලයෙකු විය නොහැකි ය. කුරුසිය දරාගෙන මා අනුව නොඑන තැනැත්තාට මාගේ ගෝලයෙකු විය නොහැකිය. ඔබ අතරෙන් යමෙක් මුර අටල්ලක් ගොඩ නැගීමට අදහස් කරයි නම්, එය නිම කරලීමට කොතරම් වියහියදම් ඇද්දැයි පළමුකොට හිඳ ගණන් නොබලන්නේද? එසේ නොකළොත්, අත්තිවාරම දමා ඒ අටල්ල නිම කරන්නට නොහැකි වූ විට එය දකින සියල්ලන් 'මේ මිනිසා ගොඩනගන්නට පටන් ගත් නමුත් නිම කරන්නට ඔහුට බැරි වී ය' යි කියා සරදම් කරනු ඇත. තවද තමන්ට විරුද්ධව විසි දහසක් රැගෙන යුද පිණිස එන රජෙකුට මුහුණ පෑමට දස දහසක් රැගෙන යා හැකි දැයි පළමුකොට හිඳ නොවිමසන කිසි යම් රජෙක් ඇත්ද? එසේ කළ නොහැකි නම්, ඔහු ඒ රජ දුර සිටිය දීම රාජ දූතයන් යවා, සාම ගිවිසුමක් ඉල්ලා සිටිනු ඇත. එමෙන්ම ඔබ අතුරින් තමන් සතු සියල්ල අත් නොහරින කිසිවෙකුට මාගේ ගෝලයෙකු වන්නට බැරිය" යි උන් වහන්සේ වදාළ සේක.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.